පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක - 2025/14

NCP/CS/PT/AP/02/Fund Acc/ 11
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2025.12. 30

සියළුම ලේකම්වරුන්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**අරමුදල් ගිණුම් වල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම - 2025.**

පළාත් සභාවේ ප්‍රඥප්ති මගින් පිහිටුවා ඇති අරමුදල් ගිණුම් වෙනුවෙන් එක් එක් මුදල් වර්ෂය අවසානයේදී අදාළ ප්‍රඥප්ති වල සඳහන් විධිවිධාන අනුව අවසාන ගිණුම් සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සියළුම අරමුදල් ගිණුම් පවත්වා ගෙන යනු ලබන ආයතන වල ප්‍රධානීන්ගේ වගකීමක් වේ.

02. ඒ අනුව, 2025 වර්ෂය සඳහා සකස් කරනු ලබන අවසාන ගිණුම්, අදාල ප්‍රඥප්ති මගින් නියම කර ඇති දිනට හෝ 2026.02.28 යන දින දෙකෙන් ප්‍රථමයෙන් එළඹෙන දිනට පෙර පහත උපදෙස් අනුගමනය කරමින් සකස් කර සහතික කිරීමෙන් අනතුරුව පළාත් භාණ්ඩාගාරයට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

2.1 වාර්ෂික ගිණුම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ (ශ්‍රී.රා.අ.ගි.ප්‍ර) ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පදනම මත සකස් කළ යුතුය.

2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ට අනුව මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් සංරචකයන් ගෙන් සමන්විත විය යුතුය.

(අ). මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය.
(ආ). මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය.
(ඇ). ශුද්ධ වත්කම්/ ස්කන්ධයේ වෙනස්වීම
(ඈ). මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.
(ඉ.). අනුමත කළ අය වැය ලේඛනයක් නිකුත් කර ඇත්නම්, මූල්‍ය ප්‍රකාශන තුල අය වැය ගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් ලෙස සහ පෙර වර්ෂයේ දත්ත සමඟ සංසන්දනාත්මකවත් සකස් කළ ගිණුම්.
(ඊ). වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල හෙළිදරව් කිරීම් සහ අනෙකුත් විස්තරාත්මක සටහන්.

2.3 ගිණුම් පිළියෙල කිරීමේදී සිංහළ, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂාත්‍රයෙන් වෙන වෙනම පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

2.4 ගිණුම් ඉදිරිපත් කිරිමේදි දෝෂ වලින් තොර විය යුතු අතර මීට පෙර වාර්ෂික මූලා ප්‍රකාශන වලට අදාලව එවා ඇති විගණන විමසුම් වලට හා විගණකාධිපති වාර්තා වලට අවධානය යොමු කොට එමගින් නිරීක්ෂිත අඩුපාඩු වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

2.5 ඉහත උපදෙස් පරිදි සකස් කර සහතික කරන ලද ගිණුම් පිටපත් 05 න් 01ක් පිටපතක් පළාත් භාණ්ඩාගාරයට හා පිටපත් 04ක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර, ගිණුම් සහතික කිරිමෙන් පසු විගණකාධිපතිවරයා විසින් පහත සඳහන් පරිදි එම ගිණුම් බෙදාහරිනු ලැබේ.

1. මුල් පිටපත - පළාත් භාණ්ඩාගාරයට
2. පළමු අනු පිටපත - අදාළ අමාත්‍යාංශයට
3. දෙවන අනු පිටපත - ගිණුම් ඉදිරිපත් කළ ආයතනයට
4. තෙවන අනු පිටපත - විගණකාධිපති විසින් රඳවා ගනු ලැබේ.

3. ඒ අනුව, ඉහත උපදෙස් පරිදි සකස් කරන ලද ගිණුම් නියමිත දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස දන්වන අතර අරමුදල් ගිණුම් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ ගණන් දීමේ නිළධාරින් විසින් මෙම කාර්ය නිසි පරිදි ඉටුකරනු ඇතැයි අපේක්ෂා කරමි.

ජේ.එම්.ආර්.සී. ජයසිංහ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත්:-01. විගණකාධිපති -දැ.පි.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව -දැ.පි.